


# ABHIMANI

The Empowered Woman

## දිවියට දිරියෙන් ලෙළදෙන අභිමානයේ ධජය ඔබයි

## 2023

MAS

දිරියෙන් ඉදිරියට

20 Year Celebrations

women go beyond

# ඒන්ජල්: භාෂා පරිවර්තනයෙන් අමතර ආදායමක්...

අපේ ගමේ ඉඳලා කිලිනොච්චිය නගරයට කිලෝමීටර් හතරක් පමණ දුරයි. මම දරුවන් පාසලට ඇරලවන්න ඒ කිලෝමීටර් හතරම පයින් තමයි ආවේ ගියේ. මගේ සැමියාටත් රැකියාවක් තිබුණේ නැහැ. එවන් ආර්ථික පරිසරයකින් තමයි 2021 මුලින්ම Vaanavill ආයතනයට ආරක්ෂාව සපයන ආරක්ෂක සේවා පෞද්ගලික සමාගමක ආරක්ෂක නිලධාරිනියක වශයෙන් සේවයට එක්වූයේ. මාස තුනක් වැනි කෙටි කාලයකදී Vaanavill ආයතනයේම කණ්ඩායම් සාමාජිකාවක ලෙස සේවයට එක්වීමට අවස්ථාව ලැබුණා. එහි මානව සම්පත් අංශයේ Petty Cashier තනතුර ලැබුණේ වගකීම් රැසක්ද සමගයි. ඒ නිසා දැඩි අවධානයෙන් සහ විශ්වාසයෙන් වැඩකරමින්, නොදන්නා දේ ගිණුම් අංශයේ නිලධාරීන්ගෙන් අසා දැනගනිමින්, නිවැරැදිව සේවය කළා. අවුරුදු දෙකක් ගතවීමත් සමග 2023 වසරේ Assistant Petty Cashier තනතුරට උසස්වීමක් ලැබුණා.

කිලිනොච්චියේ මා උපන් සමයේ පැවැති තත්ත්වය අපේ ළමා ජීවිතයේ අමිහිරි අත්දැකීම් වලින් මිදීමට මාතලේ නගරයේ ඥාති නිවසකට පැමිණියේ ආරක්ෂාව පතාගෙනයි. එහිදී යහමින් අධ්‍යාපනය ලබා භාෂා ඥානය වැඩි කරගැනීමට හැකි වුණා. ඒ දැනුම දැන් මගේ ජීවිතයට ආලෝකයක් වෙලා.

දැන් මගේ ජීවිතයේ මූලික ඉලක්කය වන්නේ මානව සම්පත් අංශයේ විධායක නිලධාරිනියක වීමයි. ඒ සඳහා සූදානම් වෙමින්, අදාළ සුදුසුකම් සපුරා ගැනීමට සහ අතිරේක දැනුම එකතු කරගනිමින් දැඩි උත්සාහයක නිරත වෙනවා. HR Management Training, Effective Workplace Communication, Lean Principles, MOS Proficiency වැනි පාඨමාලා හදාරනවා. මගේ හැකියාවන් සහ දක්ෂතාවයන් වන අභියෝගාත්මක අවස්ථාවන්හිදී සෙසු අය සමග ඵලදායි සන්නිවේදනය පවත්වා ගැනීමත් සභාවක් මැද නිර්භයව ඉදිරිපත් කිරීමේ කලාව ඉගැන්වීමත් සමග 5s, Kaizen, 8 Step, Fire and Safety Training, First Aid Training, Sign Language Proficiency, English Language Skill ආදිය පුහුණුවීම් සහ ඉගෙනගැනීම් මගේ රැකියාවේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමට අවශ්‍ය සෑම දෙයක්ම ආයතනයෙන් ලබාගැනීමට වාසනාව මට හිමිව ඇත. මේ සෑම දෙයක් තුළින්ම රාජකාරි කටයුතු පහසු කර ගැනීමටත් අභියෝග ජයගැනීමටත්, ගැටලු විසඳාගැනීමටත් ඉවහල් වුණා.
භාෂා පරිවර්තන කාර්යයේදී සිංහල කතාකරන සේවක සේවිකාවනට ක්‍රියාකාරීව සහයෝගය ලබාදෙනවා. ගමේ ළමුන්ට ස්වේච්ඡාවෙන් සිංහල භාෂාව උගන්වනවා. එසේම මම මගේ රැකියාවට අමතරව භාෂා පරිවර්තන සේවාව (Sworn Translator) ඇතුළු පෞද්ගලික ව්‍යාපාරවලද නිරත වෙමි. එයින් මම විනෝදයක්ද ලබමි. Vaanavill ආයතනයේ රැකියාවට පැමිණි පසු ගමට යාමට සහ ඊමට පහසු වනු පිණිසත්, සැමියාට රැකියාවක් ලෙසත් බස් රථයක් කල්බදු පදනමින් ලබාගත්තා. එම බස් රථයේ ආදායමින් බස් රථය සඳහා ගත් කල්බදු ණය මුදල ගෙවා දැමිය හැකිය.

නිවසේදීම සිඳගන්නා පිරිසුදු පොල්තෙල් අලෙවි කිරීමත් අමතර ආදායම් ලබන්නකි. මෙම ඉපැයීම් අප පවුලේ අවශ්‍යතාවන්වලට වියදම් කරන අතර මගේ මවත්, සුළුමවත් රැකබලා ගන්නවා. මේ හැමදෙයක්ම සාර්ථක කර ගැනීමට දැඩිව වෙහෙසන මම රැකියාවේ කටයුතු කැපවී කරනවා.

රැකියා ස්ථානයේ විවිධ අනවශ්‍ය වියදම් කපාහැරීමටත් එමගින් ආයතනයේ දියුණුවට මූල්‍ය කළමනාකරණය මගින් සහාය වීම යුතුකමක් සේ සලකා වැඩ කරනවා.




**ඒන්ජල් පද්මවදනන්**
MAS Kreeda - Vaanavil



# අංජලිකා: පෞද්ගලික ව්‍යාපාරයකට හිත යොමු කරයි

අංජලිකා අද වනවිට QCO Process-Data Entry Operator තනතුර දක්වා ඇගේ සේවා අංශයෙන් ඉහළට නැග ඇත. ඇය වසර ගණනාවක සේවා පළපුරුද්ද ලබා පියවරෙන් පියවර ඉදිරියට යමින් තම රැකියාවට අදාළව ආයතනයෙන් ලබාදුන් පාඨමාලාවන් හදාරමින්, පුහුණු වැඩසටහන්වලට සහභාගි වෙමින් ලබාගත් දැනුම සහ ප්‍රායෝගික අත්දැකීම් තුළින් එම තනතුර දක්වා පැමිණ ඇත. 2015 වසරේදී ඇය මෙම ආයතනයට සම්බන්ධ වී ඇත්තේ නිෂ්පාදන කණ්ඩායම් සාමාජිකාවක ලෙසනි. අංජලිකා 2016 වසරේදී End line Checker වරියක ලෙසත් 2017 වසරේදී Training  Data Entry Operator,  ISE Spare Parts  Room දක්වා පැමිණ 2017 සිට 2020 දක්වා කාලය තුළ Data Entry Operator  ISE Spare Parts  Room එකේ සේවා පළපුරුද්ද ලබා, අද  ඉන්නා තනතුර දක්වා පැමිණි උත්සාහවන්තියකි. ඇය තම සේවාවේ ඉහළම ඉලක්කය ලෙස සලකන්නේ විධායක නිලධාරීනියක වීමයි. ඒ සඳහා පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් අවශ්‍ය නිසා ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි අපේක්ෂිකාවක ලෙස ලියාපදිංචි B.A. උපාධිය හදාරමින් සිටී. නිතරම තමාගේ දියුණුවත් ආයතනයේ දියුණුවත් ගැන සිතන ඇය QCO Story Board එක නිර්මාණය කළ අතර තම පෞද්ගලික දියුණුවට අදාළවද Online Business එකක්ද ආරම්භ කර ඇත.

භාෂා හැකියාව ඔප්නංවාලනු වස් ආයතනය විසින් ලබාදුන් ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව හදාරන්නීය. තවදුරටත් Thulitha, SAP, Shopfloor වැනි මෘදුකාංග පිළිබඳවද හදාරන්නීය. එමෙන්ම ISE අංශය මගින් පවත්වනු ලබන පුහුණු පාඨමාලාවට සහභාගි වීම මගින් දැනුම වඩාත් වර්ධනය කරගන්නීය. ආයතනය මගින් ලබාදෙන නායකත්ව පුහුණු වැඩසටහනට හා අනෙකුත් ක්‍රියාකාරකම් සඳහාද සහභාගි වී දැනුම වර්ධනය කරගැනීමට ඇය අමතක නොකළාය. Twinery ආයතනය මගින් සංවිධානය කළ Fempowering වැඩසටහනටද ඇය සහභාගි වී ඇත.

තමාගේම ව්‍යාපාරික ආයතනයක් පිහිටුවාගැනීම ඇගේ ඉලක්කයක් වී ඇත. දැනටමත් විවිධ විලාසිතා ඇඟලුම් නිර්මාණය කරමින් සිටින අංජලිකා, විලාසිතා නිර්මාණය ගැන විධිමත් අධ්‍යාපනයක් ලබාගැනීම සහ ව්‍යාපාර කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳව විධිමත් අධ්‍යාපනයක් ලබාගැනීමට සූදානමින් සිටී. මේ සඳහා MOLLIS නමින් Facebook Page එකක්ද ආරම්භ කර ඇති අතර, එයට මනා පාරිභෝගික අවධානයක් ද හිමිකරගෙන ඇත. රැකියා ස්ථානයේ මෙන්ම ව්‍යාපාරික කටයුතුවලදීද එකිනෙකා අතර මනා සුහදතාවක් ගොඩනගා ඇත.

රතුකුරුස සංවිධානයෙන් පැවැත්වූ මූලික ප්‍රතිකාර වැඩසටහනටද, මුදල් කළමනාකරණය පිළිබඳව පුහුණු වැඩසටහනටද 'අභිනන්දනී' වැඩසටහනටද, ISE අංශය මගින් පැවැත්වූ ක්‍රිකට් ක්‍රීඩා වැඩසටහනටද ඇය සහභාගි වී ඇත. ආයතනය තුළින් ලබා දුන් පුහුණු පාඨමාලාවන් සහ ඇය ඒවායින් ලැබූ අත්දැකීම් අදාළ කර ගනිමින් ඇය Data Analysis පාඨමාලාව හදාරා ඒ තුළින් Manual Document, Power BI එකක් මගින් නිර්මාණය පෙන්වීම අරමුණ විය. මේ හැරුණු විට ඇය මේ වන විට QCO ව්‍යාපෘතිය හා සම්බන්ධ සියලුම Reports, QCO, Audit සහ Daily meetings වලට දායකත්වය දෙන අතර Spare parts room, Incentive පිළිබඳවද මනා දැනුමක් හා පළපුරුද්දක් සහිතව සිටින්නීය. එපමණක් නොව TC සියලු Reports පිළිබඳවද දැනුම ඇය සතුය.




**අංජලිකා කුමාරි සේනාධීර**

Linea Aqua - Naiwala



# භාග්‍යා: පිළිකා රෝගීන්ට උදව් කරමින්

රාස්සගල නම් දුෂ්කර ගමේ සිට බලංගොඩ MAS Bodyline ආයතනයට මා සම්බන්ධ වන්නේ කණ්ඩායම් සාමාජිකාවක ලෙසිනි. ඒ 2015 වසරේදීය. 2018 වනවිට කණ්ඩායම් නායිකාව බවට පත්වීමට හැකිවිය. ඒ Finish goods warehouse group leader වශයෙනි. එම තනතුරට අදාළ වගකීම් ඉතා කාර්යක්ෂමව සහ උනන්දුවෙන් ඉටුකර පුහුණුවීම් සහ පළපුරුද්ද ලබා, විධායක ශ්‍රේණියේ ඉහළ තනතුරකට යෑම මගේ පුද්ගලික බලාපොරොත්තුව විය. එවැනි තනතුරක් සඳහා මා සතු දැනුම මඳ බවක් දැනුණි. ඒ සඳහා අවැසි දේ සාක්ෂාත් කර ගැනීමට උනන්දු වුයෙමි.

ඉන් අනතුරුව MD Process, SAP, Delivery Planning, Defect Latensify වැනි වැඩසටහන් මගින් දැනුම වර්ධනය කර ගනිමි. Soft Skills වන ගැටලු නිරාකරණය, Production Process, Production Quality, Management, Coaching, Leadership, Job Instruction, Meeting Facilitation, English, IT, 5S, MOS, Health and Safety, HR Policies ආදිය පිළිබඳව පුහුණු වැඩසටහන් මගින් මෙම දැනුම ලබාගැනීමට හැකියාව ලැබුණි. 'යාත්‍රා' පුහුණු වැඩසටහනට සහභාගි වූ අතර VSM තරගාවලියටද සහභාගි වී ඇත. Power Buster ප්‍රායෝගික පුහුණුවද, MAS Kreeda ආයතනය මාර්ගයෙන් ලබාගැනීමට මම අපේක්ෂාවෙන් සිටිමි.

2023 ජනවාරි මාසයේදී නව අදහස් ඉදිරිපත් කරමින් DSI වවුචර් පහක් මම දිනාගතිමි. පෙබරවාරි, අප්‍රේල්, මැයි යන මාසවල දෙපාර්තමේන්තුවල හොඳම කාර්යක්ෂමතාව ලබාදෙමින් මුදල් ත්‍යාගය දිනා ගතිමි. Kaizen Champion ලෙස කටයුතු කිරීමට මට හැකි විය. Skill Matrix Champion ලෙසද කටයුතු කිරීමට මට අවස්ථාව ලැබී ඇත.

ආයතනයේ ගැටලු විසඳා ගැනීමට සියලු දෙනාගේ අදහස් විමසා සුදුසු අදහස් පමණක් භාවිතයට ගැනීම කණ්ඩායම් හැඟීම ඇතිකර සියලුම වැඩවලදී කණ්ඩායම් හැඟීමෙන් වැඩ කරන ලෙසට එකඟ කරවා ගැනීමද මගේ ක්‍රමයයි.

ඇස් දන්දීම සඳහාත් ශරීරයේ කොටස් දන්දීම සඳහාත් ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමයට පොරොන්දු වී ඇත. එළබටු, මිරිස්, කහ වැනි ගෙවතු වගාවන් කරන්නෙ විනෝදාංශයක් ලෙසිනි. ලේ දන්දීමේ වැඩසටහන්වලට සහභාගි වීම, පිළිකා රෝගීන්ට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ මුදල් පරිත්‍යාග කිරීම, පිළිකා රෝගීන්ට අවශ්‍ය කරන හිස්වැසුම් සැකසීම සඳහා මගේ කේශකලාපය පරිත්‍යාග කිරීම, සුදු පරෙවි කාන්තා සමාජය හරහා ඉටු කළෙමි. තවද, ගැබිණි මව්වරුන්ට අවශ්‍යවන ආහාර පාන පරිත්‍යාග කිරීම, මාසිකව පවත්වන ශීල ව්‍යාපාරයට සම්බන්ධ වීම හා වැඩිහිටියන්ට උපස්ථාන කිරීමත්, මාගේ මවට හැකි අයුරින් උවටැන් කිරීමත් මම නොපිරිහෙලා ඉටු කරමි.




**භාග්‍යා මධුමාලි වීරසිංහ**

MAS Kreeda - Balangoda



# චමිලා: තම කාර්යය මනාව ඉටුකරයි

මේ වන විට ආකල්පමය අතින් වෙනස්වීමකට ලක්වී සිටින ඇය MAS Methliya ආයතනයට කණ්ඩායම් සාමාජිකාවක ලෙස සේවයට බැඳුණු අතර, 2017 වසරේදී තම ගමන ඇරඹුවාය. තමාට පැවරෙන කාර්යභාරය මැනැවින් ඉටුකිරීමට වගබලාගත් ඇය 2021 වසර වන විට කණ්ඩායම් නායිකාවක් බවට පත්වන්නට සමත් වූවාය. MAS Methliya ආයතනය වෙතින් මනා දැනුමක් උකහා ගැනීමට සමත් වූ ඇයගේ ඊළඟ ඉලක්කය සමූහ කණ්ඩායම් නායිකාවක වීමයි.

පසුගිය වසර දෙක තුළදී ආයතනය තුළ පැවැත්වූ නායකත්ව පුහුණු වැඩසටහන්වලට ඇය නොවරදවාම සහභාගි වූවාය. පුහුණු වැඩමුළු සඳහාද සහභාගි වූ ඇය, ආයතනය මගින් පවත්වාගෙන යනු ලබන කණ්ඩායම් නායක පුහුණු වැඩසටහනටද සහභාගි වීමට අමතක නොකළාය. නිතරම කේන්ති ගන්නා කාන්තාවක වූ චමිලා නායකත්ව පුහුණු වැඩසටහනෙන් පසුව සැබෑ වෙනසකට ලක්වී ඇත. හරි දේ හරි ආකාරයට කිරීමටත් පුරුදු වුණි. කේන්ති පැමිණි විට එය මැඩපවත්වා ගැනීමට දැන් ඇයට හැකිය. කේන්තිය වෙනුවට සුහදශීලීව වැඩකිරීමේ ආශාවක් ඇතිවී ඇත. එය හිතට සතුට සහ අන් අයගේ පැසසුමට ලක්වීමටද හැකි කාරණයක් විය. සෑම දෙයක් පිළිබඳවම ධනාත්මකව සිතීමටත්, සිත් රිදවීම් අඩුකර දුර්වලතාවන් මගහරවාගෙන හොඳ ගුණාංග වර්ධනය කර ගැනීමට ඇයට හැකියාව ලැබුණි.

Cut to Box ක්‍රියාවලියේදී input 2ක් සෑදීමේදී බොහෝ අවස්ථාවල plan එක වෙනස් කරන විට විශාල WIP එකක් Module එක තුළ සෑදේ. මෙයට කණ්ඩායම් සාමාජිකාවන් තරමක් අකැමැතිය. WIP තිබියදී නැවතත් සෑදීමට සිදුවීම එයට හේතුවයි. එවැනි අවස්ථාවලදී කණ්ඩායම් සාමාජිකාවන්ට අලුත් PO සාදාගැනීමට ඇය උපකාර කර ඔවුන්ගේ අරමුණ පැහැදිලිව පවසා ආකල්පයමය වෙනසක් සිදුකරමින් අවශ්‍ය සේවාව ලබාදීමට ඇය සැමගේම සහයෝගය ලබාගත්තාය.

රැකියා ස්ථානයේ සිය කාර්යභාරය ඉටුකිරීම පමණක් නොව ආයතනය මගින් දියත් කළ වෙනත් වැඩසටහන්වලටද ඇය දායකත්වය දැක්වූයේ නොමඳවය. අලව්ව රෝහලේ පැවැති ශ්‍රමදාන වැඩසටහන සඳහා තම ශ්‍රම දායකත්වය සපයා දුන් ඇය, ආයතනය මගින් පැවැත්වූ ක්‍රිකට් තරඟාවලියටද සහභාගි වූවාය. ආයතනය මගින් පැවැත්වූ උත්සව සඳහාද තම ශ්‍රම දායකත්වය සැපයූ ඇය Future Star තරඟාවලියටද cutting අංශයේ Amigos Team මගින් සහභාගි වූවාය. Workplace health & safety සහතිකයද ලබා ඇත. තම අදහස ලෙස ඉදිරිපත් කළ Kaizen එකක් වූයේ cutting එකෙන් Module එකට in කරන cut වලට ඔවුන් ලබාදෙන Module in bar card සහ cutter bar code කුඩා table එක උඩ දැමීමේදී ඒවා නැතිවන නිසා කුඩා box එකක් සාදා bar code තබන ස්ථානයේ තබා bar code / outer bar code ලෙස කොටස් 2 කට වෙන් කිරීමෙන් ඒවාට දැමීමෙන් bar code නැතිවීම වළකා ගත හැකි වීම සහ S5 පවත්වා ගැනීමට හැකිවීමද සිදුකිරීමයි. තවද RMW එකට cutting එකෙන් ඈතට වන දොර නිතර වසා තැබීමෙන් accessories ගෙන ඒමේ දී දොර ඇරගෙන ඒම අපහසු බැවින් එය දෙපැත්තට lock 2ක් සවිකර එහි රඳවා accessories රැගෙන ඒමට සුදුසු වන ලෙස Kaizen එකක් මගින් ඉදිරිපත් කිරීමද ඇය විසින් ආයතනය සඳහා ඉටු කළ මෙහෙයයන්ය.

රැකියාවට අමතරව, අමතර ආදායමක් ලබාගැනීමේ අරමුණින් බිම්මල් ව්‍යාපාරයක්ද ඇය ආරම්භ කර ඇත. එම ව්‍යාපාරය තවත් දියුණු මට්ටමට ගෙනයාමට ඇය අදහස් කරන්නීය. ඉදිරි දෙවසර තුළ වෑන් රථයක් මිලදී ගැනීමටද ඇය අපේක්ෂා කරන්නීය. ඇය ක්‍රීඩිකාවකි, නර්තන ශිල්පිනියකි.




**චමිලා සම්පත් කුමාරි**
MAS Kreeda - Methliya



# චන්දීරා: ගමේ තරුණ තරුණියන් ධනාත්මක ආකල්ප වෙත...

Slimline ආයතනයේ කණ්ඩායම් සාමාජිකාවක ලෙස මා සේවයට පැමිණියේ 2012 වසරේදීය. මගේ නිෂ්පාදන පේලියේ අදාළ නිෂ්පාදන ප්‍රමාණය නිවැරදි තත්ත්වයෙන් පවත්වා ගැනීම මගේ වගකීම විය. 2013 වසර වනවිට AQL QC තනතුරට පත්වූ මම නිෂ්පාදන පේලි තුනකට අදාළ ඇඟලුම් තත්ත්ව පරීක්ෂාවට ලක් කළෙමි. 2014 වසරේදී Inline QC තනතුරට උසස් කරන ලදුව එම නිෂ්පාදන පේළි තුනට අදාළව පේළිවල මැහුම් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යවල නිවැරදිභාවය තත්ත්වය නිවැරදිව පවත්වාගෙන යා යුතු විය. 2015 දී සමූහ කණ්ඩායම් නායිකාවක වූ මම නිෂ්පාදන අංශයේ පේළි තුනට අදාළව ඇඟලුම්වල තත්ත්වය සහ නියමිත වේලාවට නැව්ගත කිරීම සඳහා කණ්ඩායම් ඉලක්ක කරා මෙහෙයවීම ඉටුකළෙමි.

2030 වසර වනවිට නිෂ්පාදන කළමනාකාරවරියක වීම මගේ ඉලක්කයයි. එයට අවශ්‍ය අදාළ සුදුසුකම් සපුරාලමින් සිටින මම මේ වන විට 2017 වර්ෂයේදී NIBM ආයතනයේ Advanced Diploma in Business Management පාඨමාලාව හදාරා අවසන් කළෙමි. 2018 වර්ෂයේ ඉංග්‍රීසි පාඨමාලාවක් Head Way ආයතනය තුලින් හදාරා ඇත. මේ හැරුණුවිට P.A.C.E. පුහුණුව ද MAS ආයතනය වෙතින් Technical Training පුහුණුව ද ලබා ඇත්තෙමි. 5S පුහුණුව ද MAS ආයතනයෙන් ලබාගත් මා අප ආයතනයේම ශිල්ප යාත්‍රා පුහුණුව ද ලබා සිටිමි. එසේම 2024 වර්ෂය තුළදී MBA උපාධි පාඨමාලාව හැදෑරීමටත් පරිගණක පාඨමාලාවක් හැදෑරීමටත් බලාපොරොත්තු වෙමි.

නිවසේ වැඩ නිමකර ගැනීම අද මගේ පුද්ගලික ඉලක්කයකි. වාහනයක් මිලදී ගැනීමේ අපේක්ෂාවක් ද මට තිබෙන අතර 2025 පමණ වන විට එම අපේක්ෂාවන් මුදුන් පමුණුවා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් යොදා ඇත. දරු දෙදෙනාට මනා අධ්‍යාපනයක් ලබාදීමටත් සැමියාත් දරු දෙදෙනාත් සමඟ සතුටු පවුලක් ලෙස දිවි ගෙවීමත් මගේ අපේක්ෂාවයි. දරුවන් හට ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබාදීමට මම අපේක්ෂා කරමි. ස්වයං ව්‍යාපාරයක් ලෙස පොල් කොප්පරා කර විකිණීමේ ව්‍යාපාරයක් අරඹා ඇති අතර එය වැඩි දියුණු කරගැනීමට ද මම අපේක්ෂා කරමි.

ආයතනය මගින් පැවැත්වූ විලාසිතා දැක්ම සඳහා ද නිර්මාණ ඉදිරිපත් කළෙමි. වෙසක් කූඩු නිර්මාණ තරඟයට දායක වී තුන්වන ස්ථානය දිනාගත් අතර සණස සමිතිය මගින් පැවැත්වූ ගායනා තරු තරඟයේදී අවසන් තිදෙනා අතරට තේරී පත්වුණෙමි. ආයතනය තුළදී එල්ලේ තරඟවලට සහභාගි වූ අතර එහි නායකත්වය ගෙන කටයුතු කළෙමි. ඒ තුළින් මගේ නායකත්ව හැකියාව මම ප්‍රදර්ශනය කළෙමි.

MAS ආයතනය තුළ මෙවන් පිරිසක් අතරින් මා ලැබූ ජයග්‍රහණ මගේ ප්‍රජාව වෙතද ගෙන යාමට මට හැකියාව ලැබී ඇත. එමගින් තරුණ තරුණියන් ධනාත්මක ආකල්ප කෙරෙහි යොමු කිරීමට මට හැකියාව උදාවී ඇත.




**දර්ශනී චන්දීරා**

MAS Intimates - Slimline




# චන්දිමා: ගමේ දියුණුවට මූල්‍ය සහ ශ්‍රම දායකත්වය සපයා

චන්දිමා හංවැල්ලේ Linea Aqua ආයතනයට සේවය සඳහා සම්බන්ධ වන්නේ 2009 වසරේ දී කණ්ඩායම් සාමාජිකාවක ලෙසිනි. 2012 වන විට ඇය කණ්ඩායම් නායිකාවක බවට පත්වන්නේ ඇගේ සුවිශේෂී දක්ෂතා මතය. නායිකාවක වශයෙන් ඇයට පැවරුණු වගකීම් සියල්ලම නිසි ලෙස ඉටුකරමින් තම කණ්ඩායම දවසේ ඉලක්ක සපුරාලීමට සමත් වූවාය. 2014 වන විට එපමණකින් නොනැවතුණු චන්දිමා 3Star ලාභිනියක වූවාය. ප්‍රධාන මැෂින් වර්ග නවයක (09) වැඩ කිරීමේ හැකියාව සමග එම ඕනෑම මැෂිමක සියලුම Operation එකක් නියමිත Quality එකට මැසීමට දක්ෂ වූවාය. මේ නිසා ඇය පුහුණු නිෂ්පාදන සුපරීක්ෂකවරියක ලෙස 2017 දී උසස්වීමක් ද ලැබුවාය. සිය කණ්ඩායම නියමිත ඉලක්ක කරා යොමුකරමින් කණ්ඩායමේ සාමාජිකාවන්ගේ හැකියාවන්, දක්ෂතා වැඩිදියුණු කිරීමටත් වගබලා ගත්තාය. මේ සියලුම සාර්ථකත්වයන් දුටු ආයතනික කළමනාකාරිත්වය චන්දිමා සහකාර මැහුම් තාක්ෂණික ශිල්පිනියක තත්ත්වයට 2018 වසරේදී උසස් කෙරුණි. දැන් ඇය කණ්ඩායම් කිහිපයක් මෙහෙයවමින් කණ්ඩායම් සාමාජිකාවන් හසුරුවාගනිමින් අදාළ ඉලක්ක සපුරාලමින් තම සාමාජිකාවන්ගේ හැකියාවන් සහ දක්ෂතා වර්ධනය කරවමින් සිටී.

නිෂ්පාදන විධායක නිලධාරිනියක වීම ඇගේ රැකියා ඉලක්කයයි. මාස 6ක පමණ කාලයක් තුල්හිරියේදී පුහුණු වැඩසටහනට සම්බන්ධ වූ ඇය ඒ සඳහා අවැසි සුදුසුකම් අතරින් Lean Leader and Group Leader Competency Development Program - First Batch එකට අයත් වූවාය.  MOS JFB Training ලබාගනිමින් ජයග්‍රහණද ලැබුවාය. TL / GL සංකල්පය මත ලබා දෙන සියලු පුහුණු පාඨමාලා හැදෑරුවාය. Automation Module සහ Machine පිළිබඳවද පුහුණු වූවාය. නිෂ්පාදන ක්‍රියාවලියේදී තාක්ෂණික ප්‍රශ්න මෙන්ම 5S සහ නාස්තිය අවම කිරීම වෙනුවෙන් Kaizen 50කට ආසන්න සංඛ්‍යාවක් දැනට සකසා ඉදිරිපත් කර ඇත. ආයතනය මගින් ලබාදුන් TL / GL Training Programme වලටද, 5 WHY Training වැඩසටහනටද, 8 Steps පුහුණු වැඩසටහනටද ඇය සහභාගී වී දැනුම් සම්භාරයක් ලබා ඇත.

දරුවාගේ උසස් අධ්‍යාපන කටයුතු සාර්ථකව නිමවා දරුවා විදෙස්ගත කිරීමට ඇය කැමැත්තෙන් සිටී. දැනට ඇය සතුව මෝටර් රථයක්ද ඇති අතර ඒ වෙනුවට සුඛෝපභෝගී මෝටර් රථයක් මිලදී ගැනීමට ඇය අපේක්ෂා කරන්නීය. ගමෙහි පවත්වන පොදු වැඩසටහන්වලදී හැකි සෑම අයුරින්ම ශ්‍රම හා මූල්‍යමය දායකත්වය ලබාදීමට ඇය සැදී පැහැදී සිටී.

ආයතනය තුළ පවත්වන නත්තල් උත්සවවලදී කණ්ඩායම් කුසලතා සහ ජයග්‍රහණ ලබා ඇත. Future Star වැඩසටහන්වලදී තරගවලට සහභාගී වූ ඇගේ කණ්ඩායම ප්‍රථම ත්‍රිත්වය අතරට තේරී ඇත. පිරිසක් ඉදිරියේ මනා අවධානය ලබමින් කථා කිරීමට හපන් ඇය, යම් ගැටලුවක් උද්ගත වූ විට ඒ පිළිබඳව ගැඹුරින් නිරීක්ෂණය කර නැවත එවැන්නක් සිදු නොවන ආකාරයට වැඩ කටයුතු සලසන්නීය. කණ්ඩායමක් සමග මනා සහයෝගයෙන් එක අරමුණක් කරා යාමට කණ්ඩායම මෙහෙයවීමට ඇයට ඇත්තේ මනා හැකියාවකි.




**චන්දිමා ප්‍රියදර්ශනී සමන් කුමාරි**
Linea Aqua - Hanwella



# දම්කා: තාරුණ්‍යය යහපත් මගට...

හිරිමල් තරුණ වයසේ කවුරුත් කැමතියි දුවලා පැනලා නටලා විනෝදෙන් ගත කරන්න. නමුත් මට සිදුවුණේ මගේ පවුලේ ආර්ථික තත්වය ගොඩනැංවීම සඳහා වෙහෙසීමටයි. අපේ පවුලේ සහෝදර සහෝදරියන් පස් දෙනයි. අම්මයි තාත්තයි සමග හත් දෙනයි. මම පවුලේ තුන්වන දරුවා. ඒ නිසාම මම තීරණයක් ගන්නව පවුලේ බර ටිකක් හෝ අඩුකර පවුලේ අයට සහනයක් ලබා දිය යුතුයි කියලා. පුත්තලම වැනි දුෂ්කර ප්‍රදේශයක සිට කටුනායකට තනියම ඇවිත් රැකියාවක් සොයමින් ඉන්න අතරේ තමයි MAS Active Shadowline ආයතනයට සම්බන්ධ වන්නට වාසනාව ලැබුණේ. ඒක මගේ පෙර පිනකට ලැබුනු ත්‍යාගයක් කියලා දැන් මගෙ හිත මටම ආශිර්වාද කරනවා.

2003 දී Shadowline ආයතනයට සම්බන්ධ වන්නේ ආධුනික නිෂ්පාදන කණ්ඩායම් සාමාජිකාවක වශයෙනි. 2007 වසර වන විට කණ්ඩායම් නායිකාව වශයෙන් උසස්වීම් ලැබෙනවා. ඒ සමගම සාමාජිකාවන් 45 දෙනෙකුට නායකත්වය දෙමින් ඉතාමත් ක්‍රියාශිලීව සහයෝගයෙන් කණ්ඩායම සමග KPI සාක්ෂාත් කරගැනීම නිසා 2012 වසරේ දී සාම්පල් මැසීම සඳහා මාව තේරී පත්වුණා. 2018 දී මට තවත් ශක්තියක් ලබා දෙමින් ස්ථාන මාරුවක් සමගින් MAS Active Nirmaana ආයතනයේ Production Engineering අංශයේ වැඩ අධීක්ෂිකා තනතුර ලැබුණි. දැන් මගේ සිහිනය සහ ඉලක්කය 2024 වන විට විධායක තාක්ෂණික නිලධාරිණියක වීමයි. ඒ සඳහා අවශ්‍ය දැනුම සහ පළපුරුද්ද සොයා යමින් ඉංග්‍රීසි දැනුම පුළුල් කර ගැනීමට අවශ්‍ය පංති වලට සහභාගි වෙමි. ICT දැනුම ලබාගැනීමට E-SOFT ආයතනයේ පාඨමාලාවක් හදාරමි. එසේම SLITA ආයතනයේ Diploma in Textile & Apparel Technology Diploma යන වෘත්තීය පුහුණු පාඨමාලාද හදාරමි. ඒ අතර ආයතනයෙන් මට පැවරී ඇති වගකීම් සියල්ල ඉටුකරමින් සතුටින් ජීවිතයට මුහුණ දෙමි.

මා ගත් තනි තීරණ නිසා පෞද්ගලික දියුණුවද සාර්ථක විය. මහගෙදර අංග සම්පූර්ණ නිවසක් කර ගතිමි. යහපත් ස්වාමි පුරුෂයකු සමග විවාහ වීමි. කටුනායක අවටින් ඉඩමක් මිලට ගෙන නිවසක්ද සාදා ගතිමි. දැනට පෞද්ගලික ව්‍යාපාරයක් ලෙස මහන මැෂින් දෙකක් මිලට ගෙන මගේ නිවසේම කොටසක නව විලාසිතාවේ ඇඟලුම් මැසීම ආරම්භ කර, අසල්වැසි කාන්තාවන් දෙදෙනෙකුට රැකියා ලබාදී ඇත. මේ වන විට තවත් පැඩ්ලොක් මැෂින් දෙකක් ගෙවීමේ පදනමින් ගෙන තවත් කාන්තාවන් දෙදෙනෙකුට රැකියා ලබා දී ඇත. එම ව්‍යාපාරය දියුණු කිරීම සඳහා දැනටමත් ලංකා බැංකුවේ ගිණුමක් විවෘත කර මුදල් ඉතිරි කරමි. ව්‍යාපාරයේ ප්‍රවාහන කටයුතු පහසු කරගැනීම සඳහා ත්‍රීවීලරයක් මිලට ගැනීමට සැලසුම් කරන අතර 2024 වන විට සුදුසු වාහනයක් මිලදී ගැනීම මගේත් ස්වාමිපුරුෂයාගේත් ප්‍රධාන අරමුණ වී ඇත.

MAS සමූහ ව්‍යාපාරයේ කටුනායක පිහිටි නිර්මාණ ආයතනය නිසා මට සියලු සම්පත් ලැබී ඉතා සතුටින් සිටීමේ වාසනාව පෑදී ඇත. දැන් මගේ ජීවිතයේ ඉහළම බලාපොරොත්තුව දරු සම්පත් ලැබීමයි.




**දම්කා තුෂාරි**

MAS Active - Nirmaana



# ධනුෂි: බිත්ති සැරසිලිවලින් දක්ෂතා පෙන්වා

තමා පිළිබඳව දැඩි විශ්වාසයකින් ඕනෑම කාර්යයක් කිරීමට හැකි යැයි සිතා කණ්ඩායම් සාමාජිකාවක ලෙස 2016 වසරේදී Silueta ආයතනයේ සේවයට බැඳුණු ඇය 2018 වන විට කණ්ඩායම් නායිකාවක බවට පත්වූවාය. 2021 වසරේදී සමූහ කණ්ඩායම් නායිකාවක් බවට පත්වෙමින් කණ්ඩායම් කීපයකට නායකත්වය දුන්නාය. රැකියාවෙන් උසස්වීම් ලබා ඉදිරියටම යාම ඇයගේ එකම ඉලක්කය විය.

Manager තත්ත්වයට උසස් වීම ඇගේ අභිප්‍රායයි. මේ සඳහා ඇවැසි දැනුම හා පළපුරුද්ද වැඩිකර ගැනීමට ආයතනය මගින් පවත්වන පුහුණු වැඩසටහන්වලට ඇය ඉතා ඕනෑකමින් සහභාගි වූවාය. 2015 වසරේදී උසස් පෙළ සමත් වූ ඇය 2023 වසරේදී ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරන අතර 2025 වනවිට උපාධිධාරිනියක වීමට බලාපොරොත්තු වන්නීය.

ආයතනය මගින් පැවැත්වනු ලැබූ 'විදු ප්‍රතිභා' Group Leader පුහුණු වැඩසටහනට ද ඇය සහභාගි වූයේ තම දැනුම වඩා වර්ධනය කරගැනීමට තිබූ උනන්දුව මතය. අනතුරුව Quality Circle වැඩසටහනටද GIMI ආයතනය මගින් පවත්වන ලද Executive Diploma in Apparel Management and Technology වැඩසටහන ද සහභාගි වූ ඇය ඉන් මනා පරිචයක් ලද්දීය. මෙම පුහුණු පාඨමාලා මගින් නව්‍ය ආකාරයට සිතා රාමුවකට කොටු නොවී ගැටලු විසඳා ගැනීමට දැනුම ඇයට ලැබිණි.

ආදර්ශමත් මෙන්ම දිරිය කාන්තාවක් ද ආදරණීය බිරිඳක් මෙන්ම සෙනෙහෙබර බුද්ධිමත් මවක්ද ලෙස ඇය සතුටින් පිරි යුගදිවියක් ගත කරන්නීය. පවුල් ජීවිතය හා රැකියාව සමබර ලෙස පවත්වා ගැනීමට ඇය දක්ෂතාවක් දක්වන්නීය. Kaizen ඉදිරිපත් කිරීමෙන් ආයතනයේ efficiency වැඩිකර දී ඇත.

ආයතනයෙහි වාර්ෂික ක්‍රිකට් තරඟයට ද ඇය සහභාගි වීමට අමතක නොකළාය.
කතිර මැස්මෙන් බිත්ති සැරසිලි මසා නව නිර්මාණ කිරීමට ද ඇය දක්ෂතාවක් දක්වයි. එමගින් අමතර ආදායමක් ද ඇයට ලැබේ. කාන්තාවක ලෙස ජීවිතය ජය ගෙන සාර්ථක ගමනක යන ඇය තම හිතවතියන්ටද ධෛර්යයෙන් කටයුතු කළ යුතු ආකාරය ආදර්ශයෙන්ම පෙන්වා දෙන්නීය.

රැකියා ස්ථානයේදී මෙන්ම තමා ජීවත්වන පරිසරය තුළදීද එකමුතුව සහ ඉතා සහයෝගයෙන් අන් අයගේ අදහස් නිවැරදි නම් ඒවාට සැමවිටම ගරු කිරීමටද ඇයි නිරතුරුවම සූදානමින් සිටී. තම කණ්ඩායමේ සාමාජිකාවන්ට මෙන්ම තම පවුලේ අයටත්, හිතවතුන්ටත් ඇහුම්කන් දීම ඇගේ ස්වභාවයයි. ඉතා ඉවසිලිමත්ව තම කණ්ඩායම වෙනුවෙන් පෙනී සිටින ඇය සෑමවිටම තම උපරිම කාර්යක්ෂමතාවයෙන් රැකියාව කරන්නීය.

වරෙක රැකියා ස්ථානයේ අභියෝගයන්ට මුහුණදීමට නොහැකිව සියල්ල අතහැර දමා යාමට සිතුණු අවස්ථාද ඇයට උදාවිය. එහෙත් ධෛර්යයෙන් යුක්තව ඒවාට මුහුණදුන් ඇය ක්‍රමානුකූලව තම පරිසරය සතුටුදායක එකක් බවට පත්කර ගත්තාය.




**ධනුෂි එරන්දි**

MAS Silueta



# සංජීවනී: මම වෙනුවට අපි යනුවෙන් සිතමු

දීප්ති හැම වෙලේම සෘණාත්මක සිතුවිලි දරන අයට අකැමැතිය. ධනාත්මක ආකල්ප දරන අය සමග එක්ව රාජකාරී කිරීමට කැමැතිය. එම ආභාසය ඇය ලබාගන්නේ ආයතනික පුහුණු වැඩසටහන් වලිනි. එය ඇගේ ඉක්මන් දියුණුවට මග සලසා දී තිබුණි. සමහරු ''මේක කරන්න බෑ, මට නම් එපා වෙලා ඉන්නෙ, ඇයි මෙහෙම මටම වෙන්නෙ, මගේ වෙලාව හරි නෑ'' ආදී වචන භාවිතය ඇය තරයේ ප්‍රතික්ෂේප කරයි. කම්මැලි නොවී ''මට පුලුවන්, මම කොහොම හරි කරනවා'' යනුවෙන් සිතා දවසේ වැඩ ආරම්භ කිරීම ජයග්‍රහණයේ මාවත බව ඇය දනී. ඈ ඒ බව තම යෙහෙළියන්ටද, කණ්ඩායමේ සෙසු සාමාජික සාමාජිකාවන්ටත් පහදා දී ඇත.

දීප්ති රාජපක්ෂ නුපුහුණු නිෂ්පාදන කණ්ඩායම් සාමාජිකාවක ලෙස තමාට පැවරෙන රාජකාරිය ඉටුකරමින් තම නායිකාවන් ලබාදෙන ඉලක්ක සපුරාලීම මැනවින් ඉටුකළාය. ඒ සඳහා අවශ්‍ය Tool නිවැරදිව නිසි තැනදී භාවිත කිරීමට පුරුදු වීම නිසා 2014 වැන කෙටි කාලයකින් Tools Leader තත්වයට පත්වුණි. 2015 වසරේ ඇය God Mother යන අන්වර්ථ නාමයෙන් හඳුන්වන, තම කණ්ඩායමේ සාමාජිකාවන් රැකබලාගන්නා හොඳම තැනැත්තිය බවට පත්විය. 2016/17 Jumper වරියක ලෙස Module වල Critical Operation වලට යෙදවීය. 2023 වසරේ ඇය කණ්ඩායම් නායිකාව බවට පත්විය. මේ සෑම උසස්වීමකටම ඇයට ශක්තිය වූයේ ඈ සතු ධනාත්මක ආකල්ප සහ ඇගේ ආත්ම විශ්වාසයයි. ඇගේ ඊළඟ පියවර ලෙස ඇය උත්සාහ කරමින් සිටින්නේ සමූහ කණ්ඩායම් නායිකාවක වීමටයි. එම සුදුසුකම් සපුරා ගැනීම සඳහා ඇගේ බලාපොරොත්තුවයි. දැනටමත් ඇය කැළණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිධාරිණියක් වන අතර Computer Diploma සහ English Diploma පාඨමාලාද හදාරා ඇත.

කණ්ඩායම් කළමණාකරණය පිළිබඳව මනා දැනුමක් ඇයට තිබේ. මධ්‍යස්ථ ලෙස තම සාමාජිකාවන් පිළිබඳව සිතීමටත්, ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා මනා සන්නිවේදන හැකියාවකුත් දීප්ති සතුය. සුහදශීලීව, අවංකව, ආදර්ශමත්ව සිතන පතන ඇය, 'මම' වෙනුවට සැමවිටම 'අපි' යන වචනය භාවිත කරමින් ආයතනයේ සහ ඇගේ ලෙන්ගතුකම පෙන්වා රාජකාරිය ඉටුකළාය. ආයතනය මගින් පවත්වනු ලැබූ වැඩසටහන් වලින්, ක්‍රමානුකූලව ගැටලු විසඳන ආකාරය සහ 5 why / 8 step ක්‍රමයන් පිළිබඳව දැනුම ලබා ගත්තාය. එසේම Team Leader Program (10 days) වැඩමුළුවට සහභාගි වීමටද ඇයට වාසනාව ලැබුණි.

Technical skills සහ Quality පිළිබඳව ඇති දැනුම සහ පෞද්ගලික හැකියාවන් වැඩිදියුණු කර ගනිමින් Patch work, Textile painting, Saree designing යන පාඨමාලා හදාරා ඒවා ප්‍රායෝගිකව ආදායම් මාර්ග බවට පත්කරගෙන ඇත. ඇගේ පෞද්ගලික අපේක්ෂාවන්: නිෂ්පාදන විධායකවරියක් වීම, මෝටර් රථයක් මිලදී ගැනීම, පුද්ගලික ව්‍යාපාරය දියුණු කර ගැනීම සහ දරුවා ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්කර ගැනීම ආදිය වේ.




**සංජීවනී දීප්ති රාජපක්ෂ**

MAS Active - Contourline



# දිල්රුක්ෂිකා: විනෝද චාරිකාවලට වඩා කැමතියි

තම දිවි සැරිය තුළ ඉලක්ක හඹා යමින් අභියෝග ජයගන්නා ඇය 2012 වසරේදී Linea Clothing ආයතනයට සම්බන්ධ වූයේ කණ්ඩායම් සාමාජිකාවක ලෙසිනි. ආයතනයේ ඉලක්ක සපුරාලීමට මනා සහයෝගයක් දැක්වූ කාර්යක්ෂම සාමාජිකාවක වූ ඇය 2013 වසරේදී Multi Skilled සාමාජිකාවක් බවට පත්වූවාය. යන්ත්‍ර දෙකකට වඩා ක්‍රියා කරවමින් කාර්යක්ෂමව සේවය කළ ඇය සේවයට නොපැමිණි අයගේ කොටස් ඉටුකිරීමටද සහයෝගය දැක්වූවාය. 2014 වර්ෂයේ කණ්ඩායම් නායිකාවක බවට උසස් වූ ඇය තම කණ්ඩායමේ එකමුතු බව පවත්වා ගනිමින් ආයතනයේ ඉලක්ක කරා තම කණ්ඩායම මෙහෙයවීමට දක්ෂ විය. 2018 වසර වන විට සමූහ කණ්ඩායම් නායිකා තනතුරට පත්වූ ඇය කණ්ඩායම් සාමාජිකාවන් හා කණ්ඩායම් නායිකාවන් කාර්යක්ෂම සේවයක් ලබාදීම සඳහා මෙහෙයවනු ලැබුවාය.

ආයතනයේ නිෂ්පාදන විධායක නිලධාරිනියක වීමේ ඉලක්කය හඹා යන ඇය 2024 වන විට තමා හදාරන උපාධිය අවසන් කිරීමට නියමිතය. ඊළඟට ඇය අරමුණු කරන්නේ විධායක ශ්‍රේණියේ උපාධියක් නිම කිරීමටය.

කළමණාකරණය පිළිබඳව දැනුම ලබාගැනීමට ද SIBA ආයතනයට බැඳීමට ඇය අපේක්ෂාවෙන් සිටින්නීය.

ආයතනය මගින් පවත්වනු ලැබූ රූපලාවන්‍ය පාඨමාලාවක් සඳහාද ඇය සහභාගි වූවාය. NCQP මැහුම් පාඨමාලාවද ආයතනය මගින්ම හැදෑරූ ඇය, තම දැනුම වැඩිදියුණු කර ගැනීමට උත්සුක වන්නීය.

තම නිවසේ ඉතිරි වැඩකටයුතු අවසන් කිරීම ඇගේ පෞද්ගලික ඉලක්කයකි. රූපලාවන්‍ය පාඨමාලාවෙන් ලත් දැනුම උපයෝගී කර ගනිමින් ඇය ස්වයං ව්‍යාපාරයක්ද අරඹා ඇත්තේ අමතර ආදායමක් උපයා ගැනීමේ අදහසිනි. අන් අයගේ අදහස්වලට ගරු කරමින් එදිනෙදා ඉලක්කයන් ඉටුකරමින් ඉවසීමෙන් නොපිරිහෙලා තම සේවය ලබාදෙමින් ජීවත්වන ඇය විනෝද චාරිකා සඳහා තම සාමාජිකයන් සහභාගි කරගන්නීය. නව සාමාජිකාවන් සමගද මනා සුහදතාවයකින් යුතුව ඇය කටයුතු කරන්නීය.

ආයතනය මගින් උත්සව පවත්වන අවස්ථාවන්හිදී නොමඳ සහායක් ලබා දුන් ඇය, 2018 වර්ෂයේදී පාඨමාලා අවසන් කළ පසු පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ප්‍රමාණයක් රැස්කර ගත්තාය.

තමන් ලැබූ මොඩියුලය 100% ක් කාර්යක්ෂමව ඉටුකිරීම, මොඩියුල තුළ orders 100% close කිරීම, OTD නිවැරදි කිරීම ආදිය ඇය අකුරටම ඉටු කළාය. 111633011 යන මෝස්තරය යටතේ කණ්ඩායම තුළ අපතේ යාම් වළකා, කාර්යක්ෂමව ඵලදායීතාව වැඩිදියුණු කළාය. ඒ හරහා නියමිත දින නැව්ගත කිරීම් කළ හැකි විය.

තම දරුවන්ගේ ඉගෙනුම් කටයුතු සාර්ථක කර ගැනීම අරමුණු කරගත් ඇය, සැමියා සමග ප්‍රීතිමත් පවුලක් ගොඩනගාගෙන ඇත. හදිසි අනතුරකින් එක්තැන්වී සිටින තම කණ්ඩායම් සහායිකාවකගේ නිවසේ අවශ්‍යතාවන් පවා සපුරාලමින් ඇය මහත් මෙහෙයක් ඉටුකළාය.

සේවා ස්ථානය බැහැරව ආගමික කටයුතු සඳහාද සහභාගි වන අතර රුවන්වැලි මහා සෑයෙහි මළුව වටා පාපිසි ඇතිරීමේ කාර්යයටද ඇය සහාය වූවාය. නිෂ්පාදන අංශයේ සාමාජිකයින්ගේ මානසික සුවය පතා බෝධිපූජා පැවැත්වීම, අසනීපව සැත්කම් කළ සාමාජිකාවන්ගේ අවශ්‍යතා ආදිය ඇය ඉටුකළේ මහත් සෙනෙහසකිනි.




**දිල්රුක්ෂිකා රාජසේකර**

MAS Intimates - Linea Clothing

